**ගලේවෙල ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගලේවෙල ප්‍රාදේශිය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි දිනට 01 ලේඛන අනුව ණයහිමියන් දෙදෙනෙකුගේ ආරම්භක ශේෂය රු 1,167,665.ක් වුවද එය රු 835,272.ක් ලෙස රු 332,393.ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් විෂයන් 05 ක ශේෂයන් සමග ඊට අදාල ලේඛන හා උපලේඛන සමඟ සැසඳීමේදී රු40,857,666 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | අදාළ උපයෝගී ලේඛන නිවැරදිව සකස් කර ගැනීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |

### 1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ගලේවෙල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පාසල් දරුවන්ට පාසල් උපකරණ කට්ටල බෙදාදීම සඳහා රු.3,012,985 ක් වැයකර තිබුණි. | ගරු ආණ්ඩුකාර තුමාවෙත අනුමැතියට යොමු කර ඇති බව | පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.23,495,764 ක වත්කම් විෂයන් 02 ක් හා එකතුව රු.19,573414 ක බැරකම් ශේෂ 02 කට අදාළ ලේඛන, ලිපිගොනු හා උපලේඛන , ඉදිරිපත් නොකිරිම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය | අදාල තොරතුරු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂය සඳහා උපලේඛන, ලේඛන පවත්වා ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 81, 85 හා 92 වන වගන්ති | බෙලියකන්ද සියඹලා වැව් රක්ෂිතයේ ඇති වගුරු ඉඩමට බාහිර පාර්ශවයක් විසින් පස් පිරවීම හා අනවසර ඉදිකිරීම් හේතුවෙන් ජලය වැවට ගලා යාමට තිබුණු ස්වාභාවික ජල බස්නා මාර්ගය අවහිර වී තිබූ අතර එහි වැසිකිළිය ඉදිකිරීම් හේතුවෙන් වැවෙහි ජලයට මල අපද්‍රව්‍ය එකතු වීමේ ඉඩකඩක් පැවතුණි. | පරික්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) 93 සිට 95 දක්වා වගන්ති | ගලේවෙල ප්‍රාදේශිය සභාවේ ගලි රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගලි රථ සේවාවක් පවත්වාගෙන යන නොයන අතර මල අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් ද නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) 41 අංක 1978 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ වන ජේදය 30 (2) හා (1) | දක්වා 2021 හා 2018 කාලපරිච්ඡේදය තුල නිකුත් 246 කරන ලද සංවර්ධන බලපත්‍ර ක් සඳහා වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි . | නිලධාරි හිඟය හේතුවෙන් පරීක්ෂණ කටයුතු සිදුකිරීමේ අපහසුතාවයක් පවතින අතර ආසන්න වසර 05 ක ඉදිකිරීම් වල තත්වය පරීක්ෂා කරමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ජේදයේ 1.3 හා 1.2 වගන්ති | නිලධාරින් දෙනෙකු 15 සමාලෝචිත වර්ෂය තුල නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව ක් සේවයට පැමිණ 303 දින .නොතිබුණි | නිවාඩු අයදුම්පත් ලබාගැනීමටත් ඉදිරියේදි නිවාඩු ලබාගැනිමට පෙර නිවාඩු අනුමත කරවා ගැනීමත් සිදුකරන බව. | ආයතන සංග්‍රහයේ වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව හඳුනාගෙන තිබූ GI බට 09 ක ඌණතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඌන GI බට භාරදෙන බවට ගබඩා භාරකරු දන්වා ඇති බව හා එසේ නොවුන හොත් අලාභය අයකරගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 19 ක මාස 01 සිට මාස 07 දක්වා කාලයට අදාළ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ඊ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| ල්අප්‍රේ 2009 දිනැති අංක 16 දරන 2009/09 ලේඛයවක්‍ර | නිලධාරීන් පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | යන්ත්‍රය අක්‍රීය වී ඇති අතර එය අලුත්වැඩියා කිරීමට හෝ නව යන්ත්‍රයක් මිලට ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2009 වර්ෂයේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද ට්‍රැක්ටර් රථයක් සභාවට පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ 31 පුනරාවර්තනවියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.16,404,939 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,080,579 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 2,000,000 | 1,927,067 | 2,268,194 | 920,224 | 2,000,000 | 1,916,325 | 1,260,764 | 1,261,351 |
| (ii). කුලී | 4,881,000 | 4,647,488 | 4,640,418 | 135,174 | 5,750,000 | 4,822,163 | 4,651,138 | 128,103 |
| (iii). බලපත්‍ර ගාස්තු | 4,450,000 | 5,141,032 | 5,913,402 | - | 4,250,000 | 4,390,625 | 4,309,625 | 772,370 |
| (iv). වෙනත් ආදායම් | 46,866,000 | 28,611,276 | 18,112,597 | 22,097,163 | 41,890,000 | 29,979,382 | 25,449,885 | 11,598,483 |
| එකතුව | 58,197,000 | 40,326,863 | 30,934,611 | 23,152,561 | 53,890,000 | 41,108,495 | 35,671,412 | 13,760,307 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| (i) 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු පනත අනුව කටයුතු නොකර 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු අයකරගෙන තිබුණි. | දේපල තක්සේරු කිරීම හා වරිපනම් බදු සංශෝධනය කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | |
|---|---|---|
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවති වරිපනම් හිඟය රු 920,223.ක් වු අතර ඉන් ඒකක 67 කින් එකතුව රු 526,506.ක් වු හිඟ වරිපනම් බදු වර්ෂ 02 සිට වර්ෂ 05 ක කාලයක සිට අය නොවී පැවතියද අංක 1987 දේශීය සභා පනතේදරන ප්‍රා 15158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අයකරගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රජයේ ආයතන වලින් අයවිය යුතු එකතුව රු 85,440.ක හිඟ වරිපනම් අයකර නොතිබුණි. | එම | එම |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| (i) සභා කාර්යාල පරිශ්‍රයේ සවිකර තිබුණු කිලෝවොට් 40 සූර්ය පැනල පද්ධතිය මඟින් නිෂ්පාදිත විදුලි ඒකක විදුලි බල මණ්ඩලයට ලබාදිමෙන් ලැබිය යුතු රු.109,377 ක් සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයකර නොතිබුණි. | එම | එම |
| (ii) සභා බල ප්‍රදේශයේ ප්‍රචාරන දැන්වීම් පිළිබඳ නියැදි පරික්ෂණයට අනුව ව්‍යාපාර ස්ථාන 48 ක දැන්වීම් පුවරු 50 ක් වාර්ෂික සමීක්ෂණයේදී හදුනාගෙන නොතිබීම හේතුවෙන් රු.113,500 ක ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායමක් අයකර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර ආදායම් අයකරගන්නා බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 22 වගන්තිය ප්‍රකාරව අනුබෙදුම් කරන ලද ඉඩම් වලින් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සභාවට පවරන ලද සභා බල ප්‍රදේශයේ අක්කර 03 රූඩ් 01 පර්චස් 06 ක වපසරියක ඉඩම් වලින් සමන්විත ඉඩම් කොටස් 09 ක ඉඩම් ප්‍රජා හා විනෝද කටයුතු වලට යොදවා ගැනීමකින් තොරව පැවතිණි.සමහර ඉඩම් අනවසර පදිංචිකරුවන්ගේ භාවිතය සඳහා යොදවාගෙන තිබුණි | ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු සිදුකරන බව. | අදාල ඉඩම් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වාහන 05 ක අනතුරු සිදුවී වසර 03 ½ සිට වසර 07 දක්වා කාලයක් ගතව තිබුණද මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණය සිදුකර අලාභයන් හා වගකිව යුතු පාර්ශවයන් හදුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදුකරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) විසින් පුස්තකාල ඩිජිටල් පද්ධතියක් මගින් ක්‍රියාත්මක කිරිම සඳහා පරිගනක ඇතුළු අයිතම 22 ක උපකරණ 167 ක ප්‍රමාණයක් ගලේවෙල මහජන පුස්තකාලය වෙත ලබාදි තිබුණි. 2022 නොවැම්බර් 26 දින ඩිජිටල් පුස්තකාලය ස්ථාපිත කිරිමට 2022 ජුනි 28 දින ඩිජිටල් කාඩ්පත් 2000ක් ලැබි තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් එහි සක්‍රිය සාමාජිකයින් 1667 කට ඩිජිටල් කාඩ්පත් නිකුත් කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | සියලු පුස්තකාල සාමාජිකයින් වෙත නිකුත් කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට යොදාගෙන තිබුණු භූමිය මැදින් බාහිර පාර්ශවයක් විසින් සභාවේ අනුමැතියකින් හෝ අවසරයකින් තොරව අනවසර මාර්ගයක් ඉදිකර භාවිතා කරමින් පැවතුණද,ඊට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කිරිමට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | සභාවේ වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | තොග වෙළඳපල සංකීර්ණයේ කඩ කාමර 09 න් අලුත්වැඩියාවකින් තොරව අඩු පහසුකම් සහිතව කඩ කාමර 07 ක් කුලියට ලබාදී තිබුණු අතර ඉතිරි කඩ කාමර 02 ක වසාදමා තිබුණි. මෙම භූමිය හා අදාළ ඉදිකිරීම් නවීකරණය කර සභාවට වැඩි ආදායමක් ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | කඩ කාමර කඩා නැවත ඉදිකිරීමට කටයුතු කරන බව. | කඩ කාමර නවීකරණය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | තොග වෙළඳපලේ පහළ මහලේ අංක 15 දරන කඩ කාමරය තුළ ව්‍යාපාරික කටයුතු කරන අයගේ දේපල හා ජීවිත වලට අනතුරුදායක අයුරින් ඉදිකිරිම් සියල්ල ගිලාබැස ඉරිතලා අනතුරුදායක තත්වයක පැවතුණි. | කඩ කාමර කඩා නැවත ඉදිකිරිමට කටයුතු කරන බව. | අනතුරුදායක කඩ ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශිය සභා දරණ ප්‍රා 15 අංක 1987 කාරව වගන්තිය ප්‍ර 131 පනතේ දේශිය සභා අරමුදලින් යම් ප්‍රා කොටසක් ආයෝජනය කරනු ලැබිය ,හැකි වුවද සමාලෝචිත වර්ෂයේ මාස ක කාලය තුළ මහජන බැංකුවේ 12 ගලේවෙල ශාඛාවේ ජංගම ගිණුමේ 1,181,034.රුසිට රු 19,208,910.ක පරාසයක ශේෂයක් පැවතුණද එම මුදල් ආයෝජනය කිරිමට හෝ ප්‍රාදේශයේ සංවර්ධනයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්විප් ක්‍රමය යටතේ ආයෝජනය සිදුකරමින් පවතින බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ලොරි රථයක රියදුරු විසින් සාවද්‍ය ලෙස දෛනික ධාවන සටහන් සත්‍ය ධාවන කිලෝමීටර් ප්‍රමාණය ඉක්මවා ලියා තිබුණු අතර, ඊට අදාලව බිල්පත් ඉදිරිපත් කර ඉන්ධන ලීටර් 120.47 ක් වැඩියෙන් ලබාගැනිම නිසා සභා අරමුදලට රු.42,960 ක අලාභයක් සිදුව තිබුණි. | මු.රෙ.104(3) පරික්ෂණයක් සිදුකර ඉදිරික්‍රියාමාර්ග ගන්නා බව. | අලාභය අයකර විනයානුකූලව කටයුතු කල යුතුය |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.2,300,000 ක වාහන 02 ක් වර්ෂ 02 සිට 04 දක්වා කාලයක සිට නිශ්ක්‍රියව හා ඌණ උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කිරිමට කටයුතු කරන බව | වත්කම් අළුත්වැඩියා කර උපයෝජනය කල යුතුය |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ඉඩම් ක් 27 ගොඩනැගිලි ,ක් 25 ක අයිතිය පවරාගෙන 59 හා සුසාන භූමි .නොතිබුණි | ඉඩම් පවරා ගැනිමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභාවට අයත් මාදිපොල හා පිහිල්ලයාය පිහිටි හෙක්ටයාර් ක ඉඩම් සහ 0.1994 ප්‍රමාණය සඳහන් නොවන තොළඹුගොල්ලෙහි පිහිටි ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව | වත්කම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |

### 3.5 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තලකිරියාගම මහජන පුස්තකාල පරිශ්‍රයේ සභා ප්‍රතිපාදන යටතේ 2022 දෙසැම්බර් 31 දිනට රු.10,005,099 ක් වැයකර අඩක් නිමකල විශාල ප්‍රමාණයේ පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි. | වැඩ නිමකර පාඨකයින්ට පරිහරනයට විවෘත කරන බව. | ඉදිකිරීම් කටයුතු අවසන් කර භාවිතයට ගත යුතුය |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය , කාර්ය මණ්ඩලය සමඟ තථ්‍ය සැසඳීමේදි සංවර්ධන නිලධාරි තනතුරු ක් හා 02 ක් හා කම්කරු තනතුරු 14 ක් අතිරික්තව 01 රියදුරු තනතුරු .පැවතුණි | මේ සම්බන්ධව මාසිකව ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කරන බව | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත් අතිරික්ත නිලධාරින් ස්ථාන මාරු කිරිමටත් කටයුතු කල යුතුය |